# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2021/47 - 2017 ජුනි මස 02 වැනි සිකුරාදා - 2017.06.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

එල්.ඩී.බී 6/77(ii).

**1977 අංක 8 දරන උදර්පණ නීතිය**

3 වගන්තිය යටතේ නියමය

1977 අංක 8 දරන උදර්පණ නීතියෙහි 3(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, මෙම නියමය මගින් පහත සඳහන් ලෙස, එනම්, දඬුවම් නියම වූ තැනැත්තන් හුවමාරු කිරීම, පාලනය කරනු ලබන සහ හසුරුවනු ලබන ද්වීපාර්ශ්වික යාන්ත්‍රණයක් පිහිටුවීම සඳහා සහ අපරාධ වැළැක්වීම සහ එම අපරාධ සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමෙහි ලා තත් ගිවිසුමේ රාජ්‍ය පාර්ශ්වයන් අතර සහයෝගය වර්ධනය වන අයුරින් යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂතාව වැඩිදියුණු කිරීම ද සඳහා 2016 ජුනි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ විදේශීය රාජ්‍යයක් වන යුක්රේනය අතර කිව් හිදී උදර්පණ ගිවිසුමක් අත්සන් කළ බැවින් ද, එක් රාජ්‍ය පාර්ශ්වයක් අනෙක් රාජ්‍ය පාර්ශ්වයෙන් ඉල්ලීමක් කරන ලද විට හා ගිවිසුමේ වගන්තිවල යටත්ව දඬුවම් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අදාළ පාර්ශ්වයන්ගේ දේශසීමා තුළ දී සොයාගන්නා ලද නඩු පැවරීම සඳහා අවශ්‍ය වන පුද්ගලයන් සහ දණ්ඩනයට යටත්ව සිටින පුද්ගලයන්, අනෙක් පාර්ශ්වය වෙත උදර්පණය කිරීමට බැඳී සිටින බැවින් ද, ඉහත කී ගිවිසුමේ වගන්ති 1977 අංක 8 දරන උදර්පණ නීතියේ 4 වැනි වගන්තිය සමඟ අනුකූල වන බැවින් ද එකී ගිවිසුමේ සඳහන් යම් සංශෝධනයකට, සීමා කිරීමකට හෝ කොන්දේසියකට යටත්ව එකී 1977 අංක 8 දරන නීතියෙහි වගන්තීන් එකී විදේශීය රාජ්‍යය කෙරෙහි අදාළ වන බව ප්‍රකාශ කරමි.

ජනාධිපතිවරයා.

2017 ජුනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06-597

1A - PG 3547 — 437 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*